සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

53393

13.11.2019

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

තෙවන වාර ඇගයීම
ஆண்டு இறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

Learning Resource Centre R De Mazenod College Kandana

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 01 |

සැලකිය යුතුයි.

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

---

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරින්** මුද්‍රිත කොටසේ අර්ථයට **වඩාත් සමීප** අර්ථය දෙන උත්තරය තෝරන්න.

1. ප්‍රශ්නයට පිළිතුරු දෙමින් එතුමා කළේ **සුදුහුණු ගෑමකි** යි සාමාජිකයෙක් පැවසී ය.
   1. ආරක්ෂා කිරීමකි  2. පාපොච්චාරණයකි
   3. සත්‍ය වසන් කිරීමකි  4. වාක් සංග්‍රාමයකි

2. **ආතක් පාතක් නැති** අය දේශපාලනයට පැමිණ රට විනාශ කරන බව මුල්ගුරුතුමා සිය කතාවේ දී පැහැදිලි කළේ ය.
   1. කිසිදු වැදගත්කමක් නැති  2. මුදල් හිඟ
   3. පිටරටවල අය  4. මුදල් ගසාකන

3. රජයේ ආයතනවලට **පස්ස දොරෙන්** සේවකයන් බඳවා ගැනීම පිළිබඳව තරුණ සංගම් සිය විරෝධතාව පෙන්වී ය.
   1. සුදුසුකම් නැතිව  2. රහසිගතව
   2. 3. සංවිධානාත්මකව  4. අයුතු ලෙස

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. මෙතෙක් කියවනු අසා රස විඳීමට ගොඩනැඟුණු සාහිත්‍යය පසුව .................... කියවා රස විඳීමට උචිත භාෂා ශෛලියක් යොදා ගැනීමේ අභියෝගය ලේඛකයන් හමුවේ පැවතිණි.
   1. අනුකූලව  2. වින්දනාත්මකව  3. ශ්‍රැතිගෝචරව  4. ව්‍යාකරණානුකූලව

5. ග්‍රන්ථය ලියා ඇති ...................... ශෛලිය පාඨක රුචිය ඇද ගැනීමට බෙහෙවින් සමත් විය.
   1. ප්‍රවීණ  2. ප්‍රයුක්ත  3. ප්‍රස්තුත  4. ප්‍රශස්ත

6. ඉන්දීය සහනාධාර යටතේ උතුරු පළාතේ ඉදිවන ග්‍රාමීය නිවාස යෝජනා ක්‍රම ........................ සඳහා නිලධාරී පිරිසක් පැමිණ සිටිති.
   1. ප්‍රසම්පාදනය 2. නිගමනය 3. නියාමනය 4. නිමන්ත්‍රණය

7. අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** දැක්වෙන පද පෙළිය තෝරන්න.
   1. ප්‍රතිග්‍රහණ, ප්‍රජනන, ප්‍රතිදාන, ප්‍රතිපූරණ
   2. ප්‍රකරණ, ප්‍රක්ෂිප්ත, ප්‍රකිරණ, ප්‍රක්‍රමණ
   3. ප්‍රකම්පන, ප්‍රකර්ෂණ, ප්‍රකීර්ණක, ප්‍රඥප්ති
   4. ප්‍රතිදීප්ත, ප්‍රතිබිම්බ, ප්‍රභාස්වර, ප්‍රබන්ධ

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය **නිවැරදි ව** යෙදී ඇති පද පෙළිය තෝරන්න.
   1. පුස්තකාලය, සැළකිල්ල, විශ්ලේෂණ, යතාවබෝධ
   2. ගැටලු, දීර්ඝකාලීන, එළිපෙහෙළි, ප්‍රදානෝත්සවය
   3. ප්‍රස්ථාරය, කාර්යාලය, ලේඛණය, ඖෂධාලය
   4. සංඛ්‍යාව, සෙබළමුලු, සමස්ත, ළහිරු

9. එක් එක් වචනයේ **දෙවෙනි අකුරෙහි** ඉස්පිල්ල, දීර්ඝ ඇදය, දීර්ඝ පාපිල්ල හා ගැට ඇලපිල්ල අනුපිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
   1. අනිවාර්ය, කැලෑව, විරූප, ආකාංෂ්‍ය
   2. අම්මා, අරුමය, රූමත්, කෘත්‍රිම
   3. මිහිරි, මෑරැටි, සූදුරු, ශාස්තෘ
   4. පිහිටි, අකැප, අතුර, ඖචිත්‍ය

10. "අඹුදරු" යන්න අයත් වන්නේ
   1. අන්‍යාර්ථ සමාසයට ය.
   2. විභක්ති සමාසයට ය.
   3. ද්කාරාර්ථ සමාසයට ය.
   4. අව්‍යය සමාසයට ය.

11. උක්ත නාම පද දෙකක් හා අනුක්ත නාම පද දෙකක් යෙදී ඇති වරණය තෝරන්න.
   1. තෝ, මිනිසෙකු, ඔව්හු, යුෂ්මතුන්
   2. අප, මම, මවක්, අයෙක්
   3. ඔබ, ඔහු, ගැහැනියක්, ඇය
   4. වෙළෙන්දෙක්, රජිනක්, කෙනෙක්, ඈ

12. රිද්ම+අනුකූල යන පද දෙක එක් වූ විට නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
   1. රිද්මනුකූල 2. රිද්මයානුකූල 3. රිද්මානුකූල 4. රිද්මායානුකූල

13. A ගස්වල වඳුරෝ කෑ ගසති.
    B සමහරු වැටුප සඳහා රැකියාව කරති.
    C ඈ මුවැත්තියක මෙන් අහිංසක ය.
    D ලොව මල්වලින් ලස්සන වෙයි.

    ඉහත වාක්‍යවලින් සම්ප්‍රදාන හා කර්ම විභක්තිවලට අයත් වන්නේ
   1. A, C ය. 2. A, B ය. 3. B, C ය. 4. A, D ය.

- අංක 14 සිට 15 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

14. **නැණසර** ගුරු හිමියෝ සිය ශිෂ්‍ය හිමියන්ගේ දූල්සර අනාගතය අවබෝධ කර ගත්හ.
   1. ප්‍රශ්න අසන 2. ප්‍රඥාවන්ත 3. උඩඟු 4. සැර පරුෂ

15. පසු කාලයේ බොහෝ ලේඛකයෝ නවකතා සඳහා **භාෂණ රීතිය** අනුගමනය කළෝ ය.
   1. කටවහර
   2. ලිඛිත ශෛලිය
   3. ගද්‍ය පද්‍ය මිශ්‍ර රීතිය
   4. පාලි සංස්කෘත මිශ්‍ර රීතිය

16. **වැරදි ප්‍රකාශය** තෝරන්න.
   1. ස්වර දෙකක් සංයුක්තව සෑදෙන නිසා ඓ, ඖ සංයුක්ත ස්වර ලෙස හැඳින්වේ.
   2. ඞ, ඤ, ණ, න, ම අක්ෂර උච්චාරණය වනුයේ නාස් කුහරය ඔස්සේ ශබ්දය පිට වීමෙනි. මේවා වර්ගාන්තානුනාසික ලෙස හැඳින්වේ.
   3. සියලු ම ස්වර ශබ්ද ඝෝෂ ගණයට අයත් වේ.
   4. ය, ර, ල, ව යන අකුරු ස්වර හා ව්‍යඤ්ජන අතර පිහිටීම නිසා අර්ධානුනාසිකා අක්ෂර ලෙස හැඳින්වේ.

17. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.
   1. තද්ධිත - ගුණවත්, සැපවත්, ශක්තිවත්, සෙනෙහෙවත්
   2. සන්ධි - ලකුණෙන්, අනුරුත්, පවුලෙහි, දුංකොළ
   3. කෘදන්ත - බැලෙන, කීම්, රැක්කේ, නටනු
   4. අසම්භාව්‍ය ක්‍රියා - හඬත, නාවොත්, බලන විට, යද්දී

18. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නො පවත්නා** පද පෙළිය තෝරන්න.
   1. සංහරණය, සන්තුෂ්ටිය, සන්තෝෂය, සොම්නස
   2. පලු, වීර, බුරුත, හල්මිල්ල
   3. ළදැරිය, කෙල්ල, ගැටිස්සිය, තරුණිය
   4. ටෝනාඩෝ, වැලි කුණාටු, ග්ලැසියර, හිම වැසි

19. එක් එක් පද පෙළියේ දී ඇති පදවලට **සමානාර්ථ යෙදුම් පමණක්** ඇතුළත් පද පෙළිය තෝරන්න.
   1. අනංගයා - මින්දද, ප්‍රසිද්ධ - පතල, මහත - සුවිසල්, මුහුද - සිඳු
   2. වැලි - පුලින, රක්ෂාව - වෘත්තිය, ශක්‍රයා - සහසැස්, සිත - සර
   3. සිනිඳු - මෘදු, සූර්යයා - නිසාකර, සුළඟ - සමීර, ශරීරය - වෛර
   4. අනුභූතිය - අත්දැකීම, සුතන් - දරුවන්, අඥාන - මුග්ධ යත්න - උත්සාහය

20. මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නො දෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
   1. සංග්‍රාම - සටන, යුධ, කලහ, රණ
   2. රශ්මිය - කැලුම්, කිරණ, ප්‍රභා, සරද
   3. නෙළුම්මල - පද්ම, සරෝජ, සියපත, පංකජ
   4. පිපිම - විකසිත, මණි මුක්ත, ඵුල්ල, පුබුදු

21. විරුද්ධාර්ථවත් පද යුගලයක් **ඇතුළත් නො වන** වරණය තෝරන්න.
   1. ආකුල - ව්‍යාකුල
   2. උපකාර - අපකාර
   3. දායක - ග්‍රාහක
   4. පුරෝගාමී - අනුගාමී

22. ප්‍රයෝජ්‍ය ක්‍රියාවක් **යෙදී ඇති** වාක්‍යය කුමක් ද?
   1. දෙමව්පියන් ද උත්සවයට පැමිණීම මැනවි.
   2. ඔබ සුවපත් වෙහිවා.
   3. සොබා දහම් මාතාව ඉර බබළවයි.
   4. වැඩට පැමිණියා ම ඉල්ලීම ගැන කතා කරමු.

23. සෑම වචනයක ම මූර්ධජ අක්ෂරයක් **යෙදී ඇති** වරණය තෝරන්න.
   1. සෘතුව, විශේෂණ, මුඩ, රළ
   2. ධනය, ඖෂධ, රණ්ඩ, ඛනිජ
   3. ප්‍රථම, ගහ, ජය, භයානක
   4. ඎතිමා, ආශ්‍රමය, අමාව, නයන

24. **පසු පදයේ පමණක්** අර්ථයක් පෙන්වන යුගල පද සහිත වරණය තෝරන්න.
1. තරහමරහ, මහත දෙහෙත, ගසා බසා, අඹුදරු
2. අලා මුළා, පරක් තෙරක්, ආටක නාටක, හාවක් හුවක්
3. අහර දහර, උසුළු විසුළු, ණය තුරුස්, පැල පදියන්
4. හෝන්දූ මාන්දූ, මළ ඉලව්, ළමයි බමයි, අකා මකා

25. දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන පුරාණ වාරි කර්මාන්තයේ නාමය ඇතුළත් වරණය තෝරන්න.
1. තරමණඉඩු 2. පගිලේතරි 3. රබොරසොක 4. යම්රිනේන්

- අංක 26, 27 යටතේ දී ඇති අදහසට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ තෝරන්න.

26. නරක වැඩවලට මිනිසුන්ගේ සහාය නිකම් ම ලැබේ.
1. ජම්මෙට වඩා පුරුද්ද ලොකුයි ලු.
2. කිරි කළේට ගොම ඩිංගක් වැටුණා වගේ
3. එක පතේ කකා බොටුව කපන්නා වගේ
4. ගෙරි කුණට කපුටො වහන්නා වගේ

27. වර්තමානයේ සිදු වන බොහෝ දේ අසාමාන්‍ය හා පුදුම ඒවා ය.
1. අළුයට හැංගුණු ගිනි පුපුර වගේ
2. රෝමය ගිනි ගනිද්දී නීරෝ වීණා වාදනය කළා වගේ
3. අබුද්දස්ස කාලේ ලබුත් තිත්තයි රාලෙ කිව්ව ලු
4. අතිරසත් තිත්ත වෙනව ලු

28. A - සිංහල සාහිත්‍යයේ නැගීම - ජී. බී. සේනානායක
B - ජීවිතයේ ගිරි දුර්ගය - රූපක
C - <u>දිසි රනලියෙව්</u> රූ සිරි යුත් මෙපුරහන - ඉරි ඇඳි පදය උපමාවකි.
D - සම්බන්ධ - උපසර්ග

- A, B, C, D ප්‍රකාශ අතුරෙන් **නිවැරදි** වන්නේ
1. A, B හා C ය. 2. A, C හා D ය. 3. B හා D ය. 4. B, C හා D ය.

- අංක 29, 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව **නිවැරදි** වාක්‍ය තෝරන්න.

29. 1. සත්පුරුෂයන් විසින් වනසතුන් ආරක්ෂා කෙරෙති.
2. තෙපි විනය ගරුක විය යුත්තහු.
3. අපි හොඳ රටක සතුටින් සිටින්නේ කවදා ද?
4. නිලධාරීන් දෙදෙනෙක් සම්මාන හිමි කර ගත්හ.

30. 1. නදී තොමෝ ලැසි ගමනින් ඉඟි බිඟි පා ගියේය.
2. සීගිරි කාශ්‍යප රජතුමා පිතෘ ඝාතකයෙක් ද?
3. මන්ත්‍රීවරු වේලාසනින් ම පාර්ලිමේන්තුවට පැමිණ ඇත.
4. අප නොහොත් නුඹලා ඒ වැඩය කරන්නෙහු.

13.11.2019
Grade - 11
සිංහල

31. A - මා කළ සත් ක්‍රියාව .................... සිහිකර බලන්න.
B - වග වලසුන් ළඟ ........................ උතුම් ගතිගුණ දක්නට ඇත.
C - බොහෝ දෙනා ලාභ ප්‍රයෝජන ........................ පින් දහම් කරති.
D - කාලකණ්ණියා ........................ ඇත්වන්නේ යයි ඇ කීවාය.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

E - කෙරෙන් F - යළි G - තකා H - පවා.

1. G, H, E, F 2. F, H, E, G 3. H, F, G, E 4. F, H, G, E

32. කථන ව්‍යවහාරයෙන් පවතින පහත සඳහන් වාක්‍යය ලිඛිත වාක්‍යයකට හැරවූ විට නිවැරදි වන්නේ කුමක් ද?

"රියැදුරන්ගේ නොසැලකිල්ල හින්දා මිනිස්සු අනතුරුවලට පත්වෙන බවට කතාවක් තියෙනවා"

1. රියැදුරන් නොසැලකිලිමත් වීම නිසා මගීන් අනතුරට භාජනය වෙති යි මතයක් පවතී.
2. රියැදුරෝ නොසැලකිලිමත් වීම නිසා මගීහු අනතුරට පත් වේ යැයි මතයක් පවතී.
3. රියැදුරන් නොසැලකිලිමත් වීම නිසා මගීහු අනතුරට පත්වන්නේ යැයි මතයක් පවතී.
4. රියැදුරෝ නොසැලකිලිමත් වීම නිසා මගියෝ අනතුරට පත් වෙති යි මතයක් පවතී.

33. මං තනන්නෝ, වතුර මල, වෙසක් පහන, වහල්ලු යන කෙටිකතා නිර්මාණය කළ ලේඛකයන් වන්නේ

1. මහගමසේකර, ඇරැව්වල නන්දිමිත්‍ර, මාර්ටින් වික්‍රමසිංහ, ජී. බී. සේනානායක
2. මහගමසේකර, ඇරැව්වල නන්දිමිත්‍ර, ජී. බී. සේනානායක, මාර්ටින් වික්‍රමසිංහ
3. ගුණදාස අමරසේකර, ජී. බී. සේනානායක, එදිරිවීර සරච්චන්ද්‍ර, සිරි ගුණසිංහ
4. ගුණදාස අමරසේකර, ඇරැව්වල නන්දිමිත්‍ර, ජී. බී. සේනානායක, මාර්ටින් වික්‍රමසිංහ

34. **තද්භව වචන පමණක්** යෙදුණු පද පේළිය තෝරන්න.

1. කුරුලු, කල්‍යාණ, උකස්, දත්ත 2. සතර, සිරස, පසිඳු, දඹ
3 මනහර, නගර, උරග, ගජ 4. පෑන, මුදල්, බැංකු, දේශන

35. "බුද්ධු ඉදුහ බලයෙන් ඔවුන් පිළිබහා සඟුන් අතුරෙහි සිටුවූහ." යන පාඨයෙහි "පිළිබහා" යන වචනයේ අර්ථය කුමක්ද?

1. වළක්වා 2. පසු කොට 3. කරකවා 4. සසල කොට

36. පහත සඳහන් කවියේ **දෙවන පදය** තෝරන්න.

"පෙරකල් ජාතියේ පැතුවා වැන්නේ
..............................................
නරමුල් ඇඟ ඇට කිඹුලකු වැන්නේ
හැම කල් මළ දා දෝ සැප වන්නේ"

1. පරමල් පිදුවා දෝ පල දු න්නේ
2. ලීල් නැතිව නිසරුව තෙපලන්නේ
3. වාල් විඳින දුක මෙනුඹ විඳින්නේ
4. මහල්ල නුඹගේ හිමි ද අසන්නේ

Learning Resource Center
R
De Mazenod College
Kandana

37. පහත සඳහන් වන්නේ පරිවර්තනය කරන ලද ග්‍රන්ථයකින් උපුටාගත් කොටසකි. එම **පරිවර්තිත ග්‍රන්ථය** නම් කරන්න.

"ශ්‍රී ලංකාවේ නැත්තේ මොනවා ද? ඔබට සිතින් සිතාගත හැකි හැම ආශ්චර්යයක් ම එහි ඇත්තේ ය. ඔබට එහි සතුටින් විනෝදයෙන් ජීවත් විය හැක්කේ ය."

1. එදා හෙළ දිව
2. වේලාසන කොක්කු ඇවිත්
3. ලක්බිම වන සැරිය
4. බාල රාමායනය

38. රුහුණු උප භාෂාවේ 'හිමිදිරිය' යන්න හඳුන්වා ඇත්තේ

1. හිනිමිදිරියයි.
2. වයිතාලයයි.
3. කළු කපා එළියයි
4. අලියන් වේලාවයි

39. "දවස පුරා දිව වහලෙ'ව් උදය වරා
අවර ඔරා පත් වර තරඟ' තින් දරා
සරත දුරා කැරැ නහවනුව සමුදුරා
සහසකරා කර ඇදි වැන්නැ තම කරා"
යන කවියෙන් කියවෙන්නේ

1. සාගර වර්ණනාවක් ගැන ය.
2. වන වැනුමක් ගැන ය.
3. රාත්‍රී කාලය පැමිණෙන විට අහස සැරසෙන ආකාරය ගැන ය.
4. සන්ධ්‍යාවේ ඉර බැස යන ආකාරය ගැන ය.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට **වඩාත් සමීප** අදහස දෙන වරණය තෝරන්න.

"මනුෂ්‍යයාට යෝග්‍ය ජීවන ක්‍රමයක් ගැන සඳහන් බෞද්ධ ඉගැන්වීම්වල 'සම්මා කම්මන්ත' යනුවෙන් දැක්වෙනුයේ මනුෂ්‍යයාට මෙන් ම සත්ව ප්‍රජාවටත් හානිකර නො වූව ද චිරස්ථායි මෙන් ම ධාර්මික ද වූ වෘත්තීන් පිළිබඳව ය."

1. හොඳ ජීවන ක්‍රමයක් සහතික කරන බෞද්ධ ඉගැන්වීම්වල දැක්වෙන්නේ සියලු සත්වයන්ට හානිකර නො වූ දිගුකල් පවතින ධාර්මික රකියාවන් ගැන ය.

2. සම්මා කම්මන්ත යනුවෙන් බෞද්ධ ඉගැන්වීම්වල දැක්වෙන්නේ හොඳ ජීවන ක්‍රමයක් මෙන් ම යෝග්‍ය වෘත්තීන් පිළිබඳව යි.

3. මිනිස් දිවියට ගැළපෙන බෞද්ධ ඉගැන්වීම්වලින් හැමවිට ම පෙන්වන්නේ හොඳ ජීවන ක්‍රමයක් හා හොඳ රකියාවන් පිළිබඳව ධර්මානුකුල ප්‍රතිපත්තියයි.

4. අනෙක් සියලු ආගම්වලට වඩා බෞද්ධ ඉගැන්වීම්වලින් පැහැදිලි වන්නේ සම්මා කම්මන්ත හෙවත් කාටත් හානියක් නො වන හොඳ රකියාවන් පිළිබඳවයි.

**(ලකුණු 1 x 40 = 40)**

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

53580

13-11-2019

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම
ஆண்டு இறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 11 | විෂයය / பாடம் / Subject සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper III | පැය / மணித்தியாலம் / Hours 02 |

වැදගත් :- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.

* 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.

* මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

01. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

. (i) (අ) ජාතක කතා සිංහලයට නැගුනේ කුමන සියවසේ ද?
(ආ) ජාතක කතා ඇසුරෙන් රචිත කාව්‍ය ග්‍රන්ථ දෙකක් නම් කරන්න

(ii) **පටන්** සුරිඳු දුන් උපදෙස් සිහි කොට
**ඉටන්** බෙලෙන් දැමුවෙන් ගුළි අහසට
..............................................................
..............................................................

(අ) මෙම කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙහි තද කළු අකුරින් මුද්‍රිත පද දෙකේ අර්ථ වෙන වෙන ම දක්වන්න.

(iii) (අ) 'හංස සන්දේශය' ලියවුණේ කිනම් රජ දවස ද?
(ආ) එම සන්දේශය යැවෙන්නේ කවුරුන් වෙතට ද?

(iv) (අ) 'ධම්මපද' නම් ගාථා සංග්‍රහයට ලියන ලද පාළි අටුවා ග්‍රන්ථය කුමන නමකින් හැඳින්වේ ද?
(ආ) සද්ධර්මරත්නාවලිය ලියවුණේ කුමන රාජධානි සමයක ද?

(v) (අ) 'ලෙන අතහැර යෑම' සිංහබාහු නාට්‍යයේ කී වැනි අංකයට අයත් වන්නේ ද?
(ආ) එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ස්වයංලිඛිත චරිතාපදානය නම් කරන්න.

(vi) (අ) 'නොපළ ගීත' කෘතියෙහි රචකයාගේ නම කුමක් ද?
(ආ) එම රචකයා විසින් රචිත නාට්‍ය දෙකක නම් ලියන්න.

(vii) (අ) 'අඟුල්මල් දමනය' අමාවතුර ග්‍රන්ථයෙහි කී වැනි පරිච්ඡේදයේ ඇතුළත් වී ද?
(ආ) එම ග්‍රන්ථය රචනා කළ රාජධානි සමය නම් කරන්න.

(viii) මෙම කෘතිවල කතුවරුන් නම් කරන්න.
(අ) ආලකමන්දා (ආ) පිතා මහ

Learning Resource Centre R De Mazenod College Kandana

(ix) "එහෙම දෙයක් ගැන අහලවත් නැතුව ඇති මයෙ හිතේ"

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) මෙහි සඳහන් 'එහෙම දෙයක්' යනුවෙන් අදහස් කර ඇත්තේ කුමක් ද?

(x) (අ) සියබස්ලකර නම් ග්‍රන්ථයට මූලාශ්‍රය වූ කෘතිය කුමක් ද?

(ආ) එම මූලාශ්‍ර කෘතියෙහි රචකයා කවරෙක් ද?

**(ලකුණු 2×10 = 20)**

02. පහත දැක්වෙන **ගද්‍ය හා පද්‍ය පාඨ** කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) "අවුරුද්දෙ මේ කාලෙ දි මල් ඇදීම තමයි අලුත් ම පන්නෙ"

(අ) මෙම පාඨයෙහි සඳහන් **අලුත් ම පන්නේ** යන යෙදුමේ අදහස ලියන්න.

(ආ) මේ හා බැඳුණු අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ii) 'මයිලණුවන් කරා ගොසින් තමන් සමර්ථ හෙයින් උන් දන්නා ශිල්ප ඉගෙන ගෙන පයි ඇදීමෙන් හැරී ගොසින් රට මුළුල්ලේ ශිල්ප පෑ ගෙන ඇවිදිනෝ...'

(අ) මෙම පාඨයෙහි අදහස සරල බසින් ලියන්න.

(ආ) මේ හා බැඳුණු අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iii)
අයි **රාවණ** වුවත් නවතන රිසින් එන
අයි රා දහස් දිලි දුනු **කොත්** සිපත් ගෙන
ක'යි කාවලෙහි දැක සෙබළුන් රැක සිටින
**වයි ගා කරත්** මල්තුරු ගන වන හිසින

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) මෙම පද්‍යයෙන් කියැවෙන කයිකාවල නම් ස්ථානයේ ස්වභාවය විස්තර කරන්න.

(iv)
වර වෙණ නද අසමින් සිත සතොසිනි
සර හැර සියොතුන් පියපත් විදිමිනි
පුර' ඔර වසමින් සිටි රහ කුම් වැනි
සුර සෙනඟට සුරසුන් පැන වූ වැනි

(අ) ඉහත සඳහන් කවියෙහි අන්තර්ගත උපමා උපමේය වෙන් කර ලියන්න.

(ආ) සමස්ත කවියෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

(v)
නිබඳ පැසී පල **ලඹ දෙන** මිහිර'ඹය
සුවඳ විහිද සිටි විලිකුන් කැන් රඹය
නොමඳ තැනින් තැන වලු බර **වනරඹය**
එමැද වෙහෙර දිලි දුරලන සසරබය

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) ඉහත පද්‍යයේ සඳහන් ශබ්දාලංකාර දෙකක් නම් කරන්න.

**(ලකුණු 4×5 = 20)**

- **03, 04 ප්‍රශ්නවලට වචන 150-200 අතර විය යුතුයි.**

03. (i) අනුප්‍රාසාත්මක බස් වහරත්

(ii) සංවාදශීලී භාෂා භාවිතයත්

'උග්ගසේන නම් සිටු පුත්හුගේ වස්තුව' රසවත් වීමට ඉවහල් වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

සැළලිහිණි සන්දේශයේ නිර්දේශිත පද්‍ය ඇසුරෙන් එකල පැවති

(i) සමාජ තත්ත්වය හා

(ii) ආර්ථික තොරතුරු

මැනවින් නිරූපණය වේ. එක් කොටසකට උදාහරණ දෙකක් දක්වමින් පැහැදිලි කරන්න.

**(ලකුණු 15)**

04. (i) අතීත ශ්‍රී විභූතියත්

(ii) ශ්‍රමාභිමානයත්

මතුකර දැක්විය හැකි නිර්මාණයක් ලෙස 'දෑතේ කර ගැට සිඹ සනසන්නට' අගය කළ හැකි ය. එක් කොටසකට උදාහරණ දෙකක් දක්වමින් විමසන්න.

**නැතහොත්**

(i) ගැමි බස් වහර යොදා ගැනීම

(ii) අවස්ථා නිරූපණය

සඳහා කතුවරයා දැක්වූ දක්ෂතාව 'අපට වැසිකිළියක්' කෙටිකතාව ඇසුරෙන් එක් කොටසකට උදාහරණ දෙකක් දක්වමින් විස්තර කරන්න.

**(ලකුණු 15)**

- 5, 6, 7 ප්‍රශ්නවලින් **එකකට පමණක්** උත්තර ලියන්න.

05. වැසි සමයේ සුන්දරත්වය 'වස්සානය' පද්‍ය පන්තියෙන් මතුකර දක්වා ඇති අයුරු උදාහරණ **තුනක්වත්** දක්වමින් සාකච්ඡා කරන්න. **(ලකුණු 10)**

06. 'බැද්දේගම නවකතාවෙන් ගැමියන්ගේ දුඃඛිත ජන ජීවිතය පිළිබඳ තොරතුරු අනාවරණය වේ.' උදාහරණ **තුනක්වත්** දක්වමින් මේ අදහස සනාථ කරන්න. **(ලකුණු 10)**

07. 'මුනි සිරිපා සිඹිමින්නේ දරුවන්ට යහපත් ජීවිතයකට අවශ්‍ය උපදේශ සපයන පද්‍ය පන්තියක් ලෙස ද අගය කළ හැකි ය.' උදාහරණ **තුනක්වත්** දක්වමින් මේ අදහස විමසන්න.

**(ලකුණු 10)**

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

53634

13-11-2019

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම
ஆண்டு இறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | II | පැය / மணித்தியாலம் / Hours | 02 |

- ප්‍රශ්න සියල්ලටම උත්තර සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

01. (i) සිට (x)තෙක් ඇති සියලු ම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) උත්පත්ති ස්ථාන අනුව අක්ෂර වර්ගීකරණය කිරීමේදී පහත දැක්වෙන අක්ෂර අයත් වන්නේ කුමන වර්ගයට දැයි ලියන්න.

(අ) ඍ, ඎ, ට, ඨ (ආ) උ, ඌ, ප, ඵ

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

"පිරිත් සජ්ඣායනා කරන විට වචන උච්ඡාරණය කිරීම පිළිබඳව සැලකිලිමත් වීම අත්‍යවශ්‍ය සාදකයකි." (අ) .............................. (ආ) ..............................

(iii)පහත සඳහන් පද සන්ධි කොට ලියා සන්ධි වර්ගය නම් කරන්න.

(අ) මහි + අංගණය (ආ) පුළුල් + උකුල

Learning Resource Center
R
De Mazenod College
Kandana

(iv)පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.

(අ) ශිථිල (ආ) නිග්‍රහ

(v) පහත සඳහන් වාක්‍යයෙහි ඇති ප්‍රත්‍යාර්ථ නාම දෙකක් උපුටා දක්වන්න.

"සරසවියගේ බැලුම් මාත්‍රයකින් වුව ද සාහිත්‍ය රස වින්දනයට පෙලඹෙන්නෝ විරල නොවෙති."

(vi)පහත දැක්වෙන වාක්‍ය සදොස් වේ නම් ඒවා නිදොස් කර නැවත ලියන්න.

(අ) ප්‍රශ්න හමුවේ අද බාලයන් මෙන් හැසිරීම යුක්ති සහගත නැති බව අයෙක් පැවසී ය.

(ආ) මේ වන විට බොහෝ ක්‍රීඩකයන් වෙහෙසට පත්වී ලූ.

(vii) පහත සඳහන් පරිමිත භාෂා ව්‍යවහාර සඳහා පොදු ව්‍යවහාර ලියන්න.

(අ) සැහැල්ලුව (ආ) ජම්පරකළුව

(viii) පහත දැක්වෙන පද්‍ය පාදවල ඉරි ඇඳි පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.

(අ) එක පැහැයෙන් <u>ඉදිතත්</u> කොවුලනට බඳු

(ආ) මත වරණිඳුට <u>පෙදෙනුන</u> වෙහෙසෙන අයුරු

(ix) පහත සඳහන් (අ) හා (ආ)යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනිපදය බැගින් ලියන්න.

(අ) නියම ස්වරූපය සැඟවී පවතින　　　　(ආ) අතීත කතා පුවත්

(x) පහත සඳහන් (අ) සහ (ආ) යෙදුම්වල පළමුවැනි වචනය සමග දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.

(අ) ගරු බහුමාන　　　　(ආ) ස්ථිර අදිටන

**(ලකුණු 2×10=20)**

02. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) අතීත සංස්කෘතියත් සාරධර්මත් අපට හුරුකර තිබුණේ සරල ජීවන රටාවකි. එහි විවේකය, සතුට, සැනසීම වැනි ගුණාංග දක්නට තිබුණි. බහු භාණ්ඩික වීමත්, නාගරීකරණයත් නිසා ලෝකය වෙනස් මගකට ඇද දැමීමෙන් මේ සියල්ල වෙනස් විය. එබැවින් එකිනෙකා වශයෙනුත් සමාජයක් වශයෙනුත් මේ පිළිබඳව අලුතින් සිතන්නට කාලය එළඹ තිබේ.

(ආ) ස්වභාවධර්මයා මිනිසාට එරෙහිව ක්‍රියාකරන්නට වීම නිසා භෞතික සම්පත් මෙන් ම මිනිස් සම්පත් ද දහස් ගණනින් විනාශ වූ අයුරු අප කාගේත් මතකයේ ඇත. නැවතත් සුනාමියක් හෝ වෙනත් ආපදාවක් අප රටට නොඑයි යි සිතීමට කිසිදු හේතුවක් නොමැති අතර ජීවිත හා රටේ සම්පත් රැක ගැනීමට සිදු වීමට පෙර හඳුනාගැනීමේ හැකියාව අප කවුරුත් ලබාගත යුතුයි. කුඩා දරුවාගේ පටන් වැඩිහිටියා දක්වා මෙවැනි හදිසි ව්‍යසනවලින් ආරක්ෂාවීමේ දැනුමෙන් සන්නද්ධ කළ යුතුයි.

(ඉ) වෙනත් බොහෝ රටවල මෙන් ම අප රටේ ද නිරතුරු කතාවට ලක්වන දැවෙන ප්‍රශ්නයක් ලෙස ගමනාගමන සේවාව හැඳින්විය හැකිය. ජනගහන වර්ධනයට සාපේක්ෂව ගමනාගමන ක්ෂේත්‍රය ද වර්ධනය විය යුතු ය. බොහෝ රටවල මෙම ප්‍රශ්නය විසඳා ගෙන තිබුණ ද අප රටේ ප්‍රවාහන සේවාව ගැන අපට සතුටුවීමට නොහැකි ය. ගමනාගමනය සම්බන්ධයෙන් සැලසුම් සහගත ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොවීම ද මෙම ප්‍රශ්නයට හේතු සාධක ලෙස සලකා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු ය.

(ඊ) රටක්, ජාතියක්, පවුලක් හා පුද්ගලයන් වශයෙන් මේ ඕනෑ ම මට්ටමකින් බැලුව ද පුද්ගලයෙකු විනාශ වන ප්‍රධාන ම හේතුව මත්ද්‍රව්‍ය භාවිතයයි. අද ලෝකය පුරා ම සියලු ම ජාතීන්ට ප්‍රබල ගැටලුවක් වී ඇත්තේ මෙම මත්ද්‍රව්‍ය භාවිතය හා මත්ද්‍රව්‍ය වෙළෙඳාමයි. මිනිසා මිනිසාගේ ම හතුරෙකු බවට පත්වන මේ ව්‍යසනයට බාල, තරුණ, මහලු සියල්ලෝ ම ගොදුරු වෙති. මේ සියල්ල සලකා බලා මත්ද්‍රව්‍ය භාවිතයට මෙන් ම මත්ද්‍රව්‍ය වෙළෙඳාමට ද දැඩි නීතිරීති පැනවිය යුතුයි.

**(ලකුණු 25)**

03.පහත දැක්වෙන පාඨය **වචන 60 - 70 අතර** වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

අනාගතය සඳහා යහපත් පුරවැසියන් බිහිකිරීමට දෙමාපියන් ගුරුවරුන් මෙන් ම මාධ්‍ය භාවිතය ද අතිශයින් වැදගත් මෙහෙයක් ඉටු කරයි. වර්තමානයේ රූපවාහිනී මාධ්‍යයෙන් විකාශය වන්නේ හරසුන් බොළඳ වැඩසටහන් ය. ඇතැම් මාධ්‍යකරුවන්ගේ ප්‍රධාන පරමාර්ථය වී ඇත්තේ මුදල් පසුපස හඹායාම පමණකි. මාධ්‍යකරුවා යනු ඉතා උසස් පුද්ගලයෙකු වූයේ අතීතයේ පමණක් දැ'යි දෙවරක් සිතා බැලීමට තරම් වර්තමාන මාධ්‍යකරුවාගේ අභිලාෂයන් ඉතා පහත් මට්ටමකට ඇද වැටී ඇත.

මේ තත්ත්වයෙන් වඩාත් ම පීඩාවට පත්වන්නේ ළමා පරපුර බවට දැන් දැන් මත පළ වී තිබේ. පාසල නිම වී නිවස වෙත ළඟා වෙන දරුවා ආලින්දයේ තබා ඇති රූප පෙට්ටිය අසල වාඩි වී වටිනා කාලය විනාශ කරමින් බොහෝ වේලාවක් හරසුන් වූත් ළමා මනස විකෘති කරන සුලු වූත් වැඩසටහන් නැරඹීමට ඇබ්බැහි වී ඇත. මෙහි භයානක ප්‍රතිඵලය වන්නේ ඒ ඔස්සේ පෙනී සිටින අය මෙන් හැසිරීමටත් එම චර්යාවන් අනුගමනය කිරීමටත් දරුවා පෙලඹීමයි. මෙසේ රූපවාහිනී යන්ත්‍රය ඉදිරියේ බොහෝ වේලාවක් වාඩි වී සිටීම නිසා නොයෙකුත් ශාරීරික ආබාධ මෙන් ම මානසික ආතතිය ද දරුවන්ට ඇතිවිය හැකි බව වෛද්‍ය මතයයි.

මේ කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් වැඩසටහන්හි පමණක් නොව රූපවාහිනිය මගින් ප්‍රචාරය වන වෙළෙඳ දැන්වීමෙහි පවා ගුණාත්මකභාවය රැඳෙන පරිදි ඒවා නිර්මාණය කිරීමට නිර්මාණකරුවන් දැනුම්වත් කිරීම මාධ්‍යකරුවාගේ වගකීමකි. එමෙන් ම සුභාවිත වැඩසටහන් ප්‍රවර්ධනයට රජය ද අනුබල දෙන්නේ නම් එය ජාතියේ වාසනාවකි. සංවාද, සම්මේලන, සාකච්ඡා ආදිය පැවැත්වීමෙන් පමණක් නොව මේ සඳහා ක්‍රමවත් වැඩසටහනක් දියත් කිරීමෙන් ද එය අධීක්ෂණය සඳහා විද්වත් මණ්ඩලයක් පත්කිරීමෙන් ද දායකත්වයක් ලබාදීම මෙහිදී අපේක්ෂා කෙරේ. **(ලකුණු 10)**

04. පහත දැක්වෙන ජේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අනුරාධපුර රාජධානි සමයේ සිට නුවර යුගය දක්වා වෘත්තිය නළු නිළියන් වූ බවට ඓතිහාසික හා සාහිත්‍යයික තොරතුරු වේ. සෙල්ලිපි මගින් නාටක ජනයන් පිළිබඳව කියැවෙන අවස්ථා කිහිපයක් හමු වේ. අනුරපුර යුගයට අයත් සැස්සේරුව ලිපියෙහි මෙලෙස තොරතුරු සඳහන් වේ. මෙයට අමතරව කොරවක්ගල ලිපියෙහි ද නාටක ජනයන්ගේ නාමයන් සඳහන් වන අතර පොළොන්නරුවෙහි රාජ්‍ය විචාල කල්‍යාණවතී රජින විසින් කරවන ලද සෙල්ලිපියක ද නළුවන් ගැන කිය වේ. වංශකතාවන්හී ද නාටක ජනයන් පිළිබඳ කියැවේ. මේ හැරෙන්නට නුවර යුගයේ රාජ්‍ය ලේඛනයන්හි ද නළුවන් පිළිබඳ තොරතුරු පෙනේ. 17 වන සියවසට අයත් වූ සබරගමුවේ පැරණි ලේකම් මිටියෙහි එම ප්‍රදේශයේ රාජකාරි පිළිබඳ ලේඛනයෙහි මාරපන කෝලක්කාරයා, බළන්ගොඩ නයියන්ඩිකාරයා හා වීරසංගිලියා නමින් පුද්ගල නාමයන් කිහිපයක් දැකිය හැකියි. මෙම පුද්ගල නාමයන් ඔවුන්ගේ රාජ කාර්යය හෝ වෘත්තිය අනුව පටබැඳුණු හෝ අන්වර්ථ වූ නාමයන් ය. කෝලක්කාරයා යනු නාට්‍යයක විහිළුකාරයායි. නයියන්ඩිකාරයා යනු දේවාල රංගන විශේෂයක් රඟදැක් වූ පුද්ගලයා හැඳින් වූ නාමයයි. පැරණි ශ්‍රී ලංකාවේ වාසගම හෙවත් පෙළපත් නාමය ව්‍යවහාර කරනු ලැබුයේ තම රැකියාව මුල් කොටගෙන බැවින් පූර්වෝක්ත පෙළපත් නාමයන් එවක රංග කලාව ආශ්‍රිතව පැනනැගුණු ඒවා බවට කිසිදු සැකයක් නැත.

ඉහතින් සඳහන් කරන ලද කරුණු සලකා බලන විට අනුරාධපුර යුගයේ සිට නුවර යුගය දක්වා වූ කාලයෙහි පැරණි ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවක් තිබූ බවට නිදසුන් බෙහෙ වී. ඒ පැවති රංග සම්ප්‍රදාය හුදෙක් ගැමි ජනරංග කලාවක් පමණක් නොව සම්භාව්‍යයට පත් වූ නාගරික හා රාජ්‍ය සභා ආශ්‍රිත ව වර්ධනය වූ බව පැහැදිලි ය. එබැවින් පැරණි ලංකාවේ දියුණු නාට්‍ය කලාවක් නොවීය යන්න ද එසේ නාට්‍ය කලාවක් වර්ධනය නො වූයේ ථෙරවාදී භික්ෂූන්ගේ අනිසි බලපෑම නිසා ය යන්න ද මිථ්‍යාවක් සේ සලකා බැහැර කළ යුතුව ඇත.

(1) වෘත්තීය නළු නිළියන් පිළිබඳ තොරතුරු අපට හමුවන්නේ කුමන රාජ්‍ය කාල පරාසයක් තුළදී ද?

(2) නාටක ජනයා පිළිබඳව සඳහන්ව ඇති සෙල්ලිපි දෙකක් නම් කරන්න.

(3) කෝලක්කාරයා, නයියන්ඩිකාරයා ආදීන් පිළිබඳව සඳහන් වන්නේ කුමන මූලාශ්‍රයක ද?

(4) පැරණි ලංකාවේ පෙළපත් නාමය ව්‍යවහාර වූයේ කුමක් පදනම් කොටගෙන ද?

(5) මිථ්‍යාවක් සේ සලකා බැහැර කළ යුතු වන්නේ කුමන කාරණා ද?

**(ලකුණු 2×5 = 10)**

05. නගරයෙන් මදක් ඈතින් පිහිටා ඇති නැදුන්ගමුව ගමේ පවුල් 250 ක් පමණ ජීවත් වෙති. මෙහි වැසියන්ට ඇති ගැටලුවක් වන්නේ අවුරුදු පහට අඩු දරුවන් සඳහා විධිමත් පෙර පාසලක් නොමැති වීමයි. පාසල් අධ්‍යාපනය සඳහා පෙරහුරුවක් ලබා ගැනීමටත් සමවයස් කණ්ඩායම් සමග කෙළිදෙළෙන් ගත කිරීමටත් තම දරුවන් පුරුදු පුහුණු කිරීමට ඔවුහු අපේක්ෂා කරති.

මේ සඳහා ඉඩම් කැබැල්ලක් පරිත්‍යාග කිරීමට ප්‍රදේශයේ දානපතියෙක් ඉදිරිපත් වී සිටී. මේ සියලු කරුණු සඳහන් කරමින් ඔවුන්ගේ අවශ්‍යතාව දන්වමින් ප්‍රාදේශීය සභාවේ ළමා කටයුතු අංශය භාර සභාපතිවරයා වෙත යවන රාජකාරී ලිපිය ලියන්න. ඔබ නැදුන්ගමුව ගමේ සුබසාධක සංගමයේ ලේකම් යසස් වීරවර්ධන යැයි සිතන්න.

**(ලකුණු 15)**

**නැතහොත්**

"සාරකෙත" නමැති කෘෂිකර්ම ආයතනය කාබනික පොහොර පමණක් භාවිත කරමින් පලතුරු හා එළවළු වර්ග වගා කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කරයි. ආහාරවල ඇති ගුණාත්මකබව, සෞඛ්‍යාරක්ෂිතබව හා පහසු මිල දී ගැනීමේ ක්‍රම ආදිය පිළිබඳව සඳහන් කරමින් වෙළෙඳ දැන්වීමක් සකසන්න. ඔබ එහි අලෙවි ප්‍රවර්ධන නිලධාරියා යැයි සිතන්න.

**(ලකුණු 15)**